# නිවේදනය

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම 2019(2020)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම 2019(2020) සඳහා 2023 ජූලි මස 25,26 හා 27 දිනවල පවත්වන ලද සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණවලට අදාළව එක් එක් විෂය යටතේ යෝග්‍යතා ඇගයීමේ  සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා බඳවා ගැනීමේ නිවේදනය ප්‍රකාරව සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාමලේඛනය අනුව යෝග්‍යතා ඇගයීමේ  සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය පවත්වන දිනයන් හා නියමිත වේලාවන් සඳහන් කරන ලද කැඳවීම් ලිපි අයදුම්කරුවන් විසින් අයදුම්පත්වල සඳහන් කර ඇති ලිපිනයන් වෙත මේ වන විට යොමුකරමින් පවතී. (කැඳවීම් ලිපියෙහි ආදර්ශ ආකෘතිය සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයන් හා නියමිත වේලාවන් සඳහන් කල ලේඛනය ද මේ සමඟ දක්වා ඇත)

අදාළ දිනයන් වල දක්වා ඇති වේලාවන්වල දී කැඳවීම් ලිපියෙහි සඳහන් කර ඇති උපදෙස් ප්‍රකාරව සියලු ලේඛන සකස් කරගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වෙත පැමිණිය යුතුය. (තමාට නියමිත දිනට නියමිත වේලාව තුළ පැමිණීම අනිවාර්ය වේ.)

එදිනට කැඳවීම් ලිපියෙහි අනු අංක 3 යටතේ සඳහන් සියලු ලිපි ලේඛනවල මුල් පිටපත් ඇතුළත් ගොනුවක් ද එම ලිපි ලේඛනයන්හි සහතික කරන ලද ඡායා පිටපත් ඇතුලත් කර ඊට අනුරූපි ගොනුවක් වෙනම ද ඉහත දක්වා ඇති සම්මුඛ පරීක්ෂණ අංකය සහ මණ්ඩල අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. (ලිපිගොනු කවරය සකස් විය යුතු ආකාරය දැක්වෙන ආකෘතියක් ද මේ සමඟ සඳහන් කර ඇත.) සියලුම සහතිකපත්‍ර/ලේඛන පිටපත් මත ඒවා සත්‍ය පිටපත් බවට සහතික කර තිබිය යුතුය.

කැඳවීම් ලිපියෙහි දක්වා ඇති සියලුම ඇමුණුම් ආකෘති නියමිත පරිදි සම්පූර්ණ කර නියමිත දිනට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කලයුතු අතර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු මෙම ආකෘති පත්‍ර පසු අවස්ථාවක ඉදිරිපත් කළහොත් බාර නොගන්නා බැවින් එය වෙබ් අඩවියෙන් බාගත කරගෙන කඩිනමින් සම්පූර්ණ කරවා ගැනීම අයදුම්කරුගේ වගකීමක් වේ.

තවද, එසේ බාගත කරගත් කැඳවීම් ලිපිය සම්මුඛ පරීක්ෂණ අවස්ථාව සඳහා රැගෙන ආ හැකි වේ.